සෙන්ට්‍රල් ඉන්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ් ෆයිනෑන්ස් පී.එල්.සී. තැන්පත්කරුවන්/ණය ගැනුම්කරුවන් වෙත කෙරෙන නිවේදනයයි

සෙන්ට්‍රල් ඉන්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ් ෆයිනෑන්ස් පී.එල්.සී. ආයතනය වෙත මුදල් ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාම සඳහා ශ්‍රීලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලැබ තිබූ බලපත්‍රය 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත යටතේ 2018.03.05 වන දින සිට අවලංගු කරන ලදි. තවද 2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනත යටතේ සෙන්ට්‍රල් ඉන්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ් ෆයිනෑන්ස් පී.එල්.සී. ආයතනය කල්බදු මූල්‍යකරණ ආයතනයක් ලෙස ලියාපදිංචි කර තිබූ සහතිකයද 2018.03.05 දින සිට බලපැවැත්වෙන පරිදි අවලංගු කරනු ලැබ ඇත.

මෙම දැන්වීමේ අරමුණ වන්නේ, ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා පහසුකම් යෝජනා ක්‍රමයේ විධිවිධානයන්ට යටත්ව තැන්පතු රක්ෂණයක් සහිත තැන්පත්කරුවන්ට මුදල් ගෙවීම සලකා බැලීම පිණිස සෙන්ට්‍රල් ඉන්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ් ෆයිනෑන්ස් පී.එල්.සී. ආයතනයේ මුදල් තැන්පත් කරන ලද පුද්ගලයන් හෝ ආයතන සහ එම ආයතනයෙන් ණය ලබාගත් පුද්ගලයන් හෝ ආයතන වල තොරතුරු රැස් කිරීමයි.

එබැවින් සෙන්ට්‍රල් ඉන්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ් ෆයිනෑන්ස් පී.එල්.සී. ආයතනයේ සියළුම තැන්පත්කරුවන් විසින් එම ආයතනයේ තැන්පත් කරන ලද මුදල් සහ එම ආයතනයෙන් ලබාගන්නා ලද ණය පිළිබඳ විස්තර පහත දක්වා ඇති ආකෘති පත්‍රයට අනුව පහත සඳහන් ලිපිනයට දන්වා එවන ලෙස ඉල්ලා සිටියි.

මෙම ආකෘති පත්‍රය ශ්‍රී ලංකා මහ බැංකු වෙබ් අඩවියේද ප්‍රකාශයට පත්කර ඇත. (www.cbsl.gov.lk) නිසි පරිදි සම්පූර්ණ කරන ලද ආකෘති පත්‍රය, තැන්පතු සහතිකයේ පිටපතක්/ ඉතිරිකිරීමේ ගිණුමේ නම, ලිපිනය, ගිණුම් අංකය සහ ජාතික හැඳුනුම්පත් අංකය ආදිය ඇතුළත් පිටුවේ පිටපතක් සහ අයදුම්පත්‍රය අවසානයට දක්වා ඇති අනෙකුත් අදාල තොරතුරුද සමග 2018.04.20 දිනට ප්‍රථම ලියාපදිංචි තැපෑලෙන් පහත ලිපිනයට එවිය යුතුය.

අධ්‍යක්ෂ - බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව
නො. 30, ජනාධිපති මාවත, කොළඹ 01

වැඩිදුර විමසීම් සඳහා
0112- 477258 / 0112- 477504
0112-477229 / 0112-398733

සෙන්ට්‍රල් ඉන්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ් ෆයිනෑන්ස් පී.එල්.සී. හි තැන්පත් කල තැන්පතු පිළිබඳ සහ එම ආයතනයෙන් ලබාගත් ණය පිළිබඳ විස්තර

1.) සම්පූර්ණ නම (තනි පුද්ගල / බද්ධ / ආයතන) :

2.) ජාතික හැඳුනුම්පත් අංකය/ ගමන් බලපත්‍ර/ ව්‍යාපාර ලියාපදිංචි සහතිකියේ අංකය :

3.) (අ) තැන්පතුව සිදු කරන ලද අවස්ථාවේ ලිපිනය :
(ආ) වර්තමාන ලිපිනය (ඉහත ලිපිනය වෙනස්නම්) :

4.) සම්බන්ධ කරගත හැකි දුරකථන අංක: නිවස : ජංගම :

5.) තැන්පතුවට අදාල විස්තර (2018.03.05 වන දිනට) :

ගිණුම් අංකය/ සහතිකයේ අංකය	තැන්පතු වර්ගය ඉතිරි කිරීමේ/ ස්ථාවර තැන්පතු (පුද්ගල/ බද්ධ)	තැන්පත් කරන ලද දිනය	කල්පිරෙන දිනය	තැන්පතු මුදල රු.	පොලී අනුපාතය (වාර්ෂික ප්‍රතිශතය)	අවසාන වරට පොලී මුදල් ලැබුන දිනය

6.) ණයමුදල් සම්බන්ධ විස්තර (2018.03.05 වන දිනට)

ණය ගිණුමේ අංකය	ලබාගත් මුළු මුදල රු.	ගෙවීමට ඇති ශේෂය රු.	ආපසු ගෙවීමේ කාලය	ණය ලබාගත් දිනය	පොලී අනුපාතිකය (වාර්ෂික ප්‍රතිශතය)	අවසාන වරට මුදල් ගෙවන ලද දිනය	සුරැකුම් විස්තර

මා/අප විසින් ඉහතින් සඳහන් කර ඇති විස්තර සත්‍ය හා නිවැරදි බවට මෙයින් ප්‍රකාශ කරමි.

....
දිනය අත්සන

සටහන : පහත දැක්වෙන ලිපි ලේඛණවල පිටපත්ද මේ සමග අමුණා එවිය යුතුය.

(අ) සෙන්ට්‍රල් ඉන්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ් ෆයිනෑන්ස් පී.එල්.සී. ආයතනය විසින් නිකුත් කරන ලද රිසිට්පත් හෝ සහතිකපත්.

(ආ) ජාතික හැඳුනුම්පත / ගමන් බලපත්‍රය/ ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකය (සමාගම් රෙජිස්ට්‍රාර් / ප්‍රාදේශීය ලේකම්/ ප්‍රාදේශීය සභාව).

(ඇ) බාලවයස්කාර ගිණුම් හිමියෙකු නම් බාල වයස්කරුගේ උප්පැන්න සහතිකයේ පිටපතක් සමග භාරකරුගේ ජාතික හැඳුනුම්පතේ / ගමන් බලපත්‍රයේ පිටපතක්.

(ඈ) ලියාපදිංචි නොවූ සමාජ, සමිති සමාගම්, හවුල්කාර හෝ අනෙකුත් ආයතන; ගනුදෙනු සඳහා බලයලත් පුද්ගලයන්ගේ හැඳුනුම්පතේ / ගමන්බලපත්‍රයේ පිටපතක් සමග බලය පවරන ලද ලිපියේ පිටපතක්.

අධ්‍යක්ෂ - බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව, අංක 30, ජනාධිපති මාවත, කොළඹ 01
☎ 0112477504 🖷 0112477738 @ dsnbfi@cbsl.lk